# දේශගුණ වෙනස්වීම්, ග්‍රාමීය අවකාශයට සිදු කරන බලපෑම් මොණරාගල දඹගල්ල ප්‍රදේශය ඇසුරින් සිදුකරන ලද අධ්‍යයනයක්.

කේ . එම්. සී. ප්‍රියංගනී[1]

**සංක්ෂේපය**

ගෝලීය දේශගුණය වෙනස්වීම හා ඒ ආශ්‍රිත ප්‍රතිවිපාකවලට මුහුණ දීම වර්තමානයේ ලෝක මට්ටමේ ඇති ප්‍රධාන අභියෝගයකි. ගෝලීය උෂ්ණත්වය අසාමාන්‍ය ලෙස වර්ධනය වීම හා බැඳුණ විවිධ පාරිසරික හා මානව ගැටලුවලට පිළියම් යෙදීම සඳහා වර්තමානයේ ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ විවිධ ක්‍රියා මාර්ග අනුගමනය ඉහළ මට්ටමේ පවතී. භූගෝලීය වශයෙන් සලකන කළ ඉහළ අක්ෂාංශීය රටවල අයිස් දියවීම, ගංගා පිටාර ගැලීම, අධික වර්ෂාපතනය, මුහුදු මට්ටම ඉහළ යෑම, ප්‍රමුඛ ගැටලු වන අතර, ආසියානු හා අප්‍රිකානු රටවල වර්ෂාපතනය අඩු වීම, නියඟය, ජෛව විවිධත්වයට හානි සිදුවීම හා කෘෂිකර්මයට අහිතකර ලෙස බලපෑම ප්‍රධාන ගැටලු වේ. නිවර්තන කලාපීය රටක් වන ශ්‍රී ලංකාව ද ගෝලීය දේශගුණ වෙනස්වීම් පිළිබඳ අයහපත් බලපෑම්වලට මුහුණ දී ඇති රටකි. තවමත් කෘෂිකර්මය ප්‍රධාන ආර්ථික කටයුත්ත වන ශ්‍රී ලංකාවේ දේශගුණයේ ඉතා ප්‍රකට බලපෑම සිදුව ඇත්තේ, ජල සම්පත් කෙරෙහිය. විශේෂයෙන් 82% පමණ වන ගොවි ජනතාව ජීවත්වන ග්‍රාමීය ප්‍රදේශයන්හි ජල සම්පත් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම මෙරට ආර්ථික දේහයට පමණක් නොව සමාජ හා සංස්කෘතික විපරිණාමයට ද බලපා තිබෙන බව පෙනේ. මෙම තත්ත්වය යටතේ දේශගුණ වෙනස්කම් හේතු කොට ගෙන ග්‍රාමීය ජල මූලාශ්‍රයන්ට හානි සිදු වීමත් සමඟ ග්‍රාමීය ජන සමාජයේ සිදු වී ඇති වෙනස්කම් අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මේ සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ දඹගල්ල ප්‍රදේශය නියැදියක් වශයෙන් තෝරාගත් අතර වාර්ෂික වර්ෂාපතනය 750mm අඩුවීමත්, මධ්‍ය උෂ්ණත්වය 29$^{o}$C තරම් ඉහළ වීමත්, කුඩා වැව් සහ වැසි ජලය හැරුණු කොට මහා වාරිමාර්ග හෝ වෙනත් සම්පාදන ක්‍රම ක්‍රියාත්මක නොවීමත්, ජනතාවගෙන් 70% පමණ සාම්ප්‍රදායික ගොවීන් වීමත් යන සාධක මෙම ප්‍රදේශය තෝරා ගැනීමට හේතු විය.මෙම අධ්‍යයනයේදී, වර්ෂාපතනය, උෂ්ණත්වය, වාෂ්පීකරණය, වැනි කාලගුණ විද්‍යාත්මක පරාමිතීන් මොණරාගල මඳුරුකැටිය මධ්‍යස්ථානයෙන් ලබා ගත් අතර වැව්, ඇළ මාර්ග, භූගත ජලය, වැසිදිය ටැංකි වැනි ජලසම්පත් ක්ෂේත්‍ර සමීක්ෂණවලින් සහ ජනතාවගේ ආර්ථික, සමාජීය තොරතුරු ප්‍රශ්නාවලි මඟින් සහ ඔවුන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන මඟින් ද රැස් කර ගන්නා ලදි. මෙම පර්යේෂණයට අනුව, සොයා ගනු ලැබූ වැදගත් තොරතුරු අතර ඉතා අවධානයට ලක් විය යුතු කරුණු වන්නේ, ජල හිඟය හේතුවෙන් සාම්ප්‍රදායික කෘෂිකර්මයේ නිරත වූ ජනතාවගෙන් 48% පමණ කෘෂිකාර්මික කටයුතුවලින් ඉවත්ව වෙළඳාම, ඉදිකිරීම් හා කුලී වැඩ කිරීම වැනි රැකියාවන්හි යෙදීමේ ප්‍රවණතාවක් දැක්වීමත් කෘෂිකාර්මික ඉඩම් පරිභෝජනයේ විශාල වෙනසක්, එනම් ඉඩම් වලින් 40% පමණ අත්හැර දැමීම හෝ වෙනත් කටයුතු සඳහා භාවිත කිරීමත් ය. මේ අනුව, ශ්‍රී ලංකාවේ පහළ ඌව කලාපයේ සාම්ප්‍රදායික ගොවි සමාජ පද්ධතිය බරපතල ලෙස විපරිණාමයට පත්වන බව පෙනී යයි.

**මුඛ්‍ය පද :** දේශගුණය, වෙනස්වීම, ග්‍රාමීය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, priyangani190@gmail.com